# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2195/26 - 2020 සැප්තැම්බර් මස 29 වැනි අඟහරුවාදා - 2020.09.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත**

25(1) වගන්තිය යටතේ කෙරෙන නියෝගය

1984 අංක 07 දරන පනතින් හා 1984 අංක 35 සහ 1992 අංක 02 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 25(1) වගන්තිය පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වරාය හා නාවික අමාත්‍ය පී. රෝහිත අබේගුණවර්ධන වන මම මෙහි අංක 01 සිට 03 දක්වා වන උපලේඛනවල සඳහන් බිම් කොටස්, ඉහත සඳහන් පනත මගින් පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන ශ්‍රී ලංකා වරාය අධිකාරියට එහි ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය බැවින්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්පත් කර ගෙන, එම පනත යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරා දීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 25(1) වගන්තිය ප්‍රකාරව මෙම නියෝගය මගින් අනුමත කරමි.

**පී. රෝහිත අබේගුණවර්ධන,**
වරාය හා නාවික අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹ දී ය,

**උපලේඛන අංක. 01**

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අංක J/233 දරන බටහිර කන්කසන්තුරේ ග්‍රාම නිලධාරි කොට්ඨාශයට අයත් බටහිර කන්කසන්තුරේ ග්‍රාමයේ පිහිටි එස්. ආර්. ඉලේපෙරුමාච්චි. බලයලත් මිනින්දෝරු විසින් 2020.08.11 වන දින මැන සාදන ලද S/ Mis/510A පිඹුරුපතින් සවිස්තරව සඳහන්ව ඇති ඉඩම් කැබලි අංක 01 හි මායිම් උතුරට : මුහුද දිගේ වෙන් කළ බිම ද, නැගෙනහිරට : කැබලි අංක 02 සහ කෝවිල ද, දකුණට : කෝවිල සහ පාර (නා. සං. අ.) සහ බටහිරට : ජැටිය සඳහා වෙන් කරන ලද පාරට ද මායිම් වූ හෙක්ටයාර් 6.536 හෝ අක්කර 16 පර්චස් 24 (අ. 16, රූ. 00, පර්. 24) ක වපසරියකින් යුත් ඉඩම.

**උපලේඛන අංක. 02**

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අංක J/233 දරන බටහිර කන්කසන්තුරේ ග්‍රාම නිලධාරි කොට්ඨාශයට අයත් බටහිර කන්කසන්තුරේ ග්‍රාමයේ පිහිටි එස්. ආර්. ඉලේපෙරුමාච්චි. බලයලත් මිනින්දෝරු විසින් 2020.08.11 වන දින මැන සාදන ලද S/ Mis/510A පිඹුරුපතින් සවිස්තරව සඳහන්ව ඇති ඉඩම් කැබලි අංක 02 හි මායිම් උතුරට : මුහුද දිගේ වෙන් කළ බිම, කැබලි අංක 03 සහ ශ්‍රී ලංකා රේතුවට අයත් ඉඩම, නැගෙනහිරට : මුහුද දිගේ වෙන් කළ බිම, ශ්‍රී ලංකා රේගුවට අයත් ඉඩම ද, දකුණට : පාර (නා. සං. අ) සහ කෝවිල ද , බටහිරට : කෝවිල සහ කැබලි අංක 01 බිම් කැබල්ලට මායිම් වු හෙක්ටයාර් 13.333 හෝ අක්කර 32 රූඩ් 3 පර්චස් 31 (අ. 32, රූ. 03, පර්. 31) ක වපසරියකින් යුත් ඉඩම

**උපලේඛන අංක. 03**

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අංක J/233 දරන බටහිර කන්කසන්තුරේ ග්‍රාම නිලධාරි කොට්ඨාශයට අයත් බටහිර කන්කසන්තුරේ ග්‍රාමයේ පිහිටි එස්. ආර්. ඉලේපෙරුමාච්චි. බලයලත් මිනින්දෝරු විසින් 2020.08.11 වන දින මැන සාදන ලද S/ Mis/510A පිඹුරුපතින් සවිස්තරව සඳහන්ව ඇති ඉඩම් කැබලි අංක 03 හි මායිම් උතුරට : මුහුද දිගේ වෙන් කළ බිම, නැගෙනහිරට : කැබලි අංක 02 ද, දකුණට : කැබලි අංක 02 ද, බටහිරට : මුහුද දිගේ වෙන් කළ බිම ද මායිම් වු හෙක්ටයාර් 0.371 හෝ රූඩ් 3 පර්චස් 26 (අ. 00, රූ. 03, පර්. 26) ක වපසරියකින් යුත් ඉඩම

10 - 543

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.